# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

Grade 11 - First Term Test - June 2021
පළමු වාර පරීක්ෂණය - 2021 ජූනි - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
Time : 1 Hour

## Agriculture & Food Technology I
## කෘෂි හා ආහාර තාක්ෂණය I

| 81 | S | I |
|---|---|---|

Name :- ................................................ Grade :- ........................ Index Number:- .................

❖ **නිවැරදි පිළිතුර තෝරන්න**

01. අනුරාධපුර යුගයේ ඉදිකරන ලද ප්‍රථම වැව වර්තමානයේ හඳුන්වනු ලබන්නේ,
   i. අභය වැව ලෙසය
   ii. බසවක්කුලම වැව ලෙසය
   iii. තිසා වැව ලෙසය
   iv. මින්නේරිය වැව ලෙසය

02. වර්ෂාමානයක් ස්ථානගත කිරීමේදී, පුනීලයේ කට පොළොව මට්ටමේ සිට තැබිය යුතු සම්මත උස ප්‍රමාණය
   i. 40cm ii. 30cm iii. 35cm iv. 20cm

03. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ බහුලව පැතිරී ඇති පස් කාණ්ඩය වනුයේ,
   i. රතු කහ පොඩ්සොලික් පස
   ii. රතු දුඹුරු ලැටසොලික් පස
   iii. රතු ලැටසොලික් පස
   iv. රතු දුඹුරු පස

04. තල, එඬරු හා සූරියකාන්ත යන බෝග වැදගත් වන කර්මාන්තය වන්නේ,
   i. කෙඳි නිෂ්පාදනය
   ii. ඖෂධ නිෂ්පාදනය
   iii. තෙල් නිෂ්පාදනය
   iv. සීනි නිෂ්පාදනය

05. පසේ කැට පොඩිකර, සියුම් ලෙස පස සකසා මට්ටම් කර, පාත්ති සැකසීම හඳුන්වනු ලබන්නේ,
   i. ප්‍රාථමික බිම් සැකසීම ලෙසය
   ii. ද්විතීයික බිම් සැකසීම ලෙසය
   iii. අතුරුයත් ගෑම ලෙසය
   iv. මූලික බිම් සැකසීම ලෙසය

06. උස්වූ පාත්ති සැකසීම, වඩාත් සුදුසු වන බෝගයක් වන්නේ,
   i. කංකුං ii. දඹල iii. තක්කාලි iv. ගෝවා

07. ඉතා කාර්යක්ෂම ජල සම්පාදන ක්‍රමයකි.
   i. බිංදු ජල සම්පාදනය
   ii. පිටාර ජල සම්පාදනය
   iii. බේසම් ජල සම්පාදනය
   iv. ඉසින ජල සම්පාදනය

08. කාබනික ද්‍රව්‍යය සහ රොක් පොස්පේට් යොදා ගනිමින් නිපදවනු ලබන කාබනික පොහොර වර්ගය
   i. ගොවිපල් පොහොර
   ii. කොළ පොහොර
   iii. කොම්පෝස්ට් පොහොර
   iv. පොස්පො කොම්පෝස්ට් පොහොර



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

09. පහත වල් පැළෑටි අතරින් ආගන්තුක ආක්‍රමණශීලී වල් පැළෑටියක් වන්නේ,

i. බැල තණ    ii. දිය තණ
iii. පොල් තණ    iv. ගිනි තණ

10. පරිසර හිතකාමී පළිබෝධනාශකයක් ලෙස වඩාත්ම ජනප්‍රියව ඇති ශාකමය ද්‍රව්‍යයකි.

i. කොච්චි සාරය    ii. කොහොඹ ඇට සාරය
iii. සුදුළූණු සාරය    iv. අමු පැපොල් සාරය

11. වී වගාවේදී තවාන් පැළ ලබාගැනීමට භාවිතා කරන තවාන් වර්ගයකි.

i. වැලි තවාන    ii. තවාන් පෙට්ටි
iii. ඩැපොග් තවාන    iv. නොරිදෝකෝ තවාන

12. ද්වි බීජ පත්‍රී බීජ පමණක් අඩංගු වරණය තෝරා දක්වන්න.

i. පතෝල, කරවිල, තම්පලා, මුං    ii. බඩ ඉරිඟු, මිරිස්, තම්පලා, කරවිල
iii. වම්බටු, කව්පි, වී, කඩල    iv. තල, කුරක්කන්, පොල්, සෝගම්

13. වායුව අතු බැඳීමට වඩාත් සුදුසු ශාක කාණ්ඩයකි.

i. මිදි, බුලත්, ගම්මිරිස්    ii. ලෙමන්, දෙහි, වැල්දොඩම්
iii. වද, රෝස, ජම්බු    iv. ක්‍රෝටන්, මිදි, ලෙමන්

14. පාලිත තත්ව යටතේ බෝග වගාවේදී යොදාගන්නා තාවකාලික ප්‍රචාරක ව්‍යුහයකි.

i. පොලිතීන් ගෘහය    ii. දැල් ගෘහය
iii. ලී පටි ගෘහය    iv. සරල සූර්ය ප්‍රචාරකය

15. මුල් ගිල්වූ වගාව සිදුකිරීම සඳහා වඩාත් යෝග්‍ය බෝග කාණ්ඩය වනුයේ,

i. ගෝවා, සලාද, කංකුං    ii. තක්කාලි, පිපිඤ්ඤා, බෙල් පෙපර්
iii. මාළු මිරිස්, වම්බටු, සලාද    iv. පිපිඤ්ඤා, තක්කාලි, කැන්ටලුප්

16. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක විශාලතම බහුකාර්යය යෝජනා ක්‍රමය

i. ගල්ඔය යෝජනා ක්‍රමය    ii. මහවැලි යෝජනා ක්‍රමය
iii. නිල්වලා යෝජනා ක්‍රමය    iv. ඉගිනිමිටිය යෝජනා ක්‍රමය

17. රබර් පර්යේෂණ ආයතනය පිහිටුවා ඇත්තේ,

i. ලුණුවිල    ii. තලවාකැලේ
iii. ගම්පහ    iv. අගලවත්ත

18. යල කන්නයේ සිටුවීම මගින් පමණක් පුෂ්පීකරණය සිදුවන බෝග කිහිපයකි.

i. උක්, කෝපි, ස්ට්‍රෝබෙරි    ii. කව්පි, බෝංචි, මිරිස්
iii. බීට්, කැරට්, සලාද    iv. දුම්කොළ, අර්තාපල්, තක්කාලි



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

19. කෘෂි දේශගුණික කලාප වර්ගීකරණයට පදනම් වී ඇති සාධකය,
    i. වර්ෂාපතනය හා උච්චත්වය    ii. වර්ෂාපතනය හා භූමි භාවිතය
    iii. වර්ෂාපතනය හා පස් වර්ගය    iv. උච්චත්වය හා වගා කළ හැකි බෝග

20. පසේ ඇති සියලුම අවකාශ ජලයෙන් පිරී ඇති විට හඳුන්වනුයේ,
    i. ස්ථිර මැලවීමේ අවස්ථාව    ii. ක්ෂේත්‍ර ධාරිතාවය
    iii. තාවකාලික මැලවීමේ අවස්ථාව    iv. සංතෘප්ත අවස්ථාව

21. පසේ ආම්ලිකතාවය අඩු කිරීමට පසට යොදන්නේ,
    i. යූරියා    ii. ඩොලමයිට්
    iii. ලුණු    iv. ගෙන්දගම්

22. පාංශු පැතිකඩක කාබනික ද්‍රව්‍යය බහුලව පවතින්නේ,
    i. සංචායක කලාපයේ    ii. මාතෘ පාෂාණ කලාපයේ
    iii. මාතෘ ද්‍රව්‍ය කලාපයේ    iv. විශෝධන කලාපයේ

23. කොළ පොහොර ලෙස ප්‍රයෝජනයට ගන්නා ශාක දෙකකි.
    i. වල් සූරියකාන්ත, අඬනහිරියා    ii. හාතවාරියා, මොනරකුඩුම්බිය
    iii. වැල් අල, මහෝගනී    iv. උඳුපියලිය හා ජුට්

24. බණ්ඩක්කා වගාවේ රතු කපු මකුණන්ගේ හානිය වැළැක්වීමට යොදා ගත හැකි උගුල් බෝගයකි.
    i. බතල    ii. මිරිස්
    iii. කපු කිනිස්ස    iv. නිවිති

25. වැටි හා කාණු සහිත පාත්ති වල සිටුවිය හැකි බෝග වර්ග දෙකක් වන්නේ,
    i. තක්කාලි, මිරිස්    ii. බතල, රටකජු
    iii. බණ්ඩක්කා, රාබු    iv. මිරිස්, අන්නාසි

26. බීජ තවාන් කර ලබාගත් පැළ ක්ෂේත්‍රයේ සිටුවීම කරනු ලබන බෝග කිහිපයකි,
    i. බෝංචි, දඹල, කැකිරි    ii. මිරිස්, කැරට්, රාබු
    iii. තක්කාලි, ගෝවා, සලාද    iv. කරවිල, වැටකොළු, පතෝල

27. දුර්වල ජලවහනය නිසා,
    i. පසේ වාතනය යහපත් වේ    ii. ශාක ඇද වැටේ.
    iii. බීජ ප්‍රරෝහණය හොඳින් සිදුවේ.    iv. හිතකර ක්ෂුද්‍ර ජීවීන් වර්ධනය වේ.

28. පහත මූලද්‍රව්‍ය අතරින් ක්ෂුද්‍ර පෝෂකයක් වන්නේ,
    i. නයිට්‍රජන්    ii. පොස්පරස්
    iii. යකඩ    iv. පොටෑසියම්

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

29. බඩඉරිඟු ශාක වල මේරූ පත්‍ර අග්‍ර දම් පැහැයක් ගන්නේ කුමන වගා පෝෂකයක් ඌනවීම නිසාද?
 i. පොස්පරස් ii. නයිට්‍රජන් iii. පොටෑසියම් iv. මැග්නීසියම්

30. වී, බඩ ඉරිඟු, කුරක්කන් යන බෝග අයත්වන කුලය
 i. ෆැබේසියේ ii. පොඒසියේ iii. සොලනේසියේ iv. මැල්වේසියේ

31. සත්ත්ව බලයෙන් ක්‍රියාකරන බිම් සැකසීමේ උපකරණයකි,
 i. අත් පෝරුව ii. තැටි පෝරුව iii. භූමණ පෝරුව
 iv. ඇණ දත් පෝරුව

32. මූල මණ්ඩලයට හානි නොවන ලෙස පැළ ලබාගැනීමට වඩා සුදුසුම තවාන් ක්‍රමය වන්නේ,
 i. නොරිදෝකෝ තවාන් ii. බඳුන් තවාන් iii. උස් තවාන් iv. ගිල්වූ තවාන්

33. සොලනේසියේ හා කුකබිටේසියේ කුල වල බෝග වලට බහුලව වැළඳෙන බැක්ටීරියා රෝගය නම්
 i. දියමලන්කෑම ii. පත්‍ර විචිත්‍රය iii. හිටු මැරීම iv. ඇන්ත්‍රැක්නෝස්

34. අර්ධ රූපාන්තරයක් පෙන්වන කෘමියෙකු වන්නේ,
 i. පුරුක් පණුවා ii. කූඩිත්තා iii. ඉල් මැස්සා iv. එපිලැක්කා

35. වී බෝගය පීදීමේ අවස්ථාවේ සිට කරල් මේරීමේ අවස්ථාව දක්වා ගත වන දින ගණන
 i. 30 ii. 45 iii. 50 iv. 60

36. සමන්පිච්ච ශාකයකින් එකවර පැල කිහිපයක් ලබා ගැනීමට සුදුසු අතු බැඳීමේ ක්‍රමය
 i. සරල අතු බැඳීම ii. සංයුක්ත අතු බැඳීම
 iii. වායව අතු බැඳීම iv. භෞමික අතු බැඳීම

37. ඉඟුරු සහ කහ ශාකවල ඇති භූගත කඳන් වර්ගය
 i. රෛසෝම ii. කෝම iii. බල්බ iv. ස්කන්ධ ආකන්ධ

38. සූර්ය ප්‍රචාරයක තුල
 i. උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය අඩුය ii. උෂ්ණත්වය අඩුය, ආර්ද්‍රතාවය වැඩිය
 iii. උෂ්ණත්වය වැඩිය, ආර්ද්‍රතාවය අඩුය iv. උෂ්ණත්වය හා අර්ද්‍රතාවය වැඩිය

39. පටක රෝපණය මගින් පැළ ලබා ගත හැකි පළතුරු බෝගය වන්නේ,
 i. අඹ හා කෙසෙල් ii. අන්නාසි හා අඹ
 iii. කෙසෙල් හා අන්නාසි iv. දොඩම් හා රඹුටන්

40. වී වගාවේදී මඩ ක්‍රමයට බිම් සකස් කිරීමේ නිවැරදි පිළිවෙල වන්නේ,
 i. පුරන්හීය, නියර මඩ තැබීම, දෙවන හීය, පෝරු ගෑම
 ii. දෙවන හීය, නියර මඩ තැබීම, පුරන් හීය, මඩ කිරීම හා පෝරු ගෑම
 iii. නියර මඩ තැබීම, පුරන් හීය, දෙවන හීය, මඩ කිරීම හා පෝරු ගෑම
 iv. පුරන් හීය, දෙවන හීය, නියර මඩ තැබීම, මඩ කිරීම හා පෝරු ගෑම

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

Grade 11 - First Term Test - June 2021
පළමු වාර පරීක්ෂණය - 2021 ජූනි - 11 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 Hour

## Agriculture & Food Technology II
## කෘෂි හා ආහාර තාක්ෂණය II

| 81 | S | II |
|---|---|---|

Name :- ................................................ Grade :- ........................ Index Number:- .................

❖ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. ගොවීන් පිරිසක් මහ කන්නයේදී, වියළි කලාපයේ කුඹුරු යායක වී වගා කිරීමට ද වී වගාවට ජලය ප්‍රමාණවත් නොවන කාලවලදී මෙම කුඹුරු වල අතිරේක ආහාර බෝග වගා කිරීමට සැලසුම් කරන ලදී.

i. මඩ වී වගාවේදී සිදුකරනු ලබන බිම් සකස් කිරීමේ පියවර අනුපිළිවෙලින් ලියන්න.

ii. මෙම ක්ෂේත්‍රයෙහි වගා කිරීමට සුදුසු පාරම්පරික වී ප්‍රභේද හතරක් නම් කරන්න.

iii. වැඩිදියුණු කළ වී ප්‍රභේද වල දක්නට ලැබෙන ලක්ෂණ හතරක් ලියන්න.

iv. මෙම ක්ෂේත්‍රයේ සිටුවීමට ගොයම් පැළ ලබා ගැනීමට සකස් කළ හැකි තවාන් වර්ග දෙකක් ලියන්න.

v. වී වගාවට බහුලව වැලඳෙන රෝග දෙකක් ලියන්න.

vi. මෙම ක්ෂේත්‍රයට යෙදිය හැකි කාබනික පොහොර වර්ග හතරක් ලියන්න.

vii. වී වගා නොකරන කාල වලදී අතිරේක ආහාර බෝග වගා කිරීම නිසා ගොවියාට ඇතිවන වාසි දෙකක් ලියන්න.

viii. මෙම ක්ෂේත්‍රයේ වගා කළ හැකි සොලනේසියේ කුලයේ හා කුකබිටේසියේ කුලයේ බෝග වර්ග දෙක බැගින් ලියන්න.

ix. මිනිසාගේ ප්‍රෝටීන අවශ්‍යතාවය සපුරාලීමට මෙම ක්ෂේත්‍රයේ වගා කළ හැකි බෝග වර්ග දෙකක් ලියන්න.

x. ආහාරයක අඩංගු ප්‍රෝටීන මගින් ඉටුවන ප්‍රධාන කාර්යය දෙකක් ලියන්න.

(ලකුණු $2 \times 10 = 20$)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

02. බෝග වගා කිරීමට බලපාන ප්‍රධාන පාරිසරික සාධක දෙක පස සහ දේශගුණයයි. මෙම සාධක කළමනාකරණය කිරීමෙන් සාර්ථකව බෝග වගා කළ හැකිය.

i. කාලගුණය හා දේශගුණය අතර වෙනස කෙටියෙන් පහදන්න.

ii. පහත වගුව පුරවන්න.

| දේශගුණික කලාපය | ප්‍රධාන වශයෙන් ලැබෙන මෝසම් වර්ෂාව | එම වර්ෂාව ලැබෙන කාල වකවානුව (මාස) |
|---|---|---|
| තෙත් කලාපය | ........................ | .............. සිට ............. දක්වා |
| වියළි කලාපය | ........................ | .............. සිට ............. දක්වා |

iii. සරල වර්ෂාමානයක නම් කළ රූප සටහනක් අඳින්න.

iv. වර්ෂාමානයක් පිහිටුවීමේදී අවධානය යොමු කළ යුතු කරුණු 03 ක් ලියන්න.

(ලකුණු 10)

03. ශාක වර්ධක ප්‍රචාරණයේදී මවු ශාකයේ විවිධ කැබලි සිටුවීම, අතු බැඳීම, බද්ධ කිරීම හා පටක රෝපණය ආදී විවිධ ක්‍රම මගින් නව පැළ නිපදවා ගැනේ.

i. ශාක බද්ධ කිරීම යනු කුමක්ද?

ii. ශාක බද්ධ කිරීමේදී යොදා ගන්නා ග්‍රාහක ශාකයක තිබිය යුතු ලක්ෂණ දෙකක් ලියන්න

iii. සූර්ය ප්‍රචාරකයක් තුල ශාක අතු කැබලි වල මුල් ඇදීම වේගවත්ය. මෙයට හේතු දෙකක් ලියන්න.

iv. වර්ධක ප්‍රචාරණයේ වාසි හතරක් ලියන්න. (ලකුණු 10)

04. බිම් සැකසීමේ සිට අස්වනු නෙළීම දක්වා කරනු ලබන ක්‍රියාකාරකම් වලදී පළිබෝධ හානි අවම කිරීමට අවධානය යොමු කළ යුතුය.

i. බෝග වගාවේදී වල් පැළෑටි පාලනය කිරීම සඳහා යොදාගත හැකි රසායනික නොවන ක්‍රම හතරක් ලියන්න.

ii. බෝග වගාවක කෘමි පළිබෝධ හානි පාලනය සඳහා යොදාගත හැකි ක්‍රම හතරක් ලියන්න.

iii. වී වගාවක තැනින් තැන ගොයම වියළී දුඹුරු පැහැ ගැන්වුණු වෘත්තාකාර ප්‍රදේශ දක්නට ලැබුණි. මෙම හානිය සිදුකරන පළිබෝධකයා නම් කර එම හානිය වැලැක්වීමට ගත හැකි රසායනික නොවන පාලන ක්‍රමයක් ලියන්න.

iv. පහත ශාක රෝග වැළඳීමට හේතු වන රෝග කාරක ජීවී කාණ්ඩය ලියන්න.

a) තවාන් පැළ දියමලන් කෑම -

b) පිපිඤ්ඤා පත්‍ර විචිත්‍ර රෝගය -

c) නිවිති මුල් ගැට රෝගය -

d) කැරට් මෘදු කුණු වීම -

(ලකුණු 10)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

05. බෝග වගාවට පරිසර සාධක ඉතා වැදගත් වේ. එම පරිසර සාධක පාලිත තත්ත්ව යටතේ වගා කිරීම සඳහා ආරක්ෂිත ගෘහ භාවිතා කරනු ලැබේ.

i) බහුලව භාවිතා කරනු ලබන ස්ථිර ආරක්ෂිත ව්‍යුහ හතරක් නම් කරන්න.

ii) පොලිතීන් ගෘහ සැකසීමේදී පහතරට ප්‍රදේශ වලදී උෂ්ණත්වය වැඩිවීම පාලනය කිරීම සඳහා භාවිතා කරන උපක්‍රම මොනවාද?

iii) පොලිතීන් ගෘහ භාවිතයේ වාසි දෙකක් හා අවාසි දෙකක් ලියන්න.

iv) ඝන මාධ්‍යය තුළ කෙරෙන නිර්පාංශු වගා ක්‍රම හතරක් නම් කරන්න. (ලකුණු 10)

06. බෝග වල අවශ්‍යතා සපිරෙන පරිදි නිසි අයුරින් බිම් සැකසීම හා නිවැරදි බෝග සංස්ථාපන ක්‍රම යොදා ගැනීම මගින් වැඩි අස්වනු ප්‍රමාණයක් අපේක්ෂා කළ හැකිවේ.

i) බෝග වගාවේදී බිම් සැකසීමේ අරමුණු හතරක් ලියන්න.

ii) බෝග වගාවේදී සකස් කරන පාත්ති වර්ග හතරක් ලියන්න.

iii) බෝග සංස්ථාපනයේදී පැළ අතර නිර්දේශිත පරතරය පවත්වා ගැනීමේ වාසි තුනක් ලියන්න.

iv) පහත වගුව පුරවන්න. (ලකුණු 10)

| උපකරණය | බිම් සැකසීමේ පියවර | යොදාගන්නා කාලය |
|---|---|---|
| හැඩ ලෑලි නගුල | ප්‍රාථමික බිම් සැකසීම | යාන්ත්‍රික බලය |
| තැටි නගුල | ............................ | ............................ |
| ඇලි වැටි දමනය (රිජරය) | ............................ | ............................ |
| ජපන් රොටරි වීඩරය | ............................ | ............................ |

07. ජල සම්පාදනය යනු බෝග වලට අවශ්‍ය අවස්ථාවල අවශ්‍ය ප්‍රමාණයට ජලය සැපයීමයි.

i) බෝග වලට යොදන ජලය පසෙන් ඉවත්වන ක්‍රම තුනක් ලියන්න.

ii) බෝග වලට ජල සම්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේදී සලකා බලන කරුණු තුනක් ලියන්න.

iii) ජල වහනය යනු කුමක්ද?

iv) ඉසින ජල සම්පාදනයේ වාසි දෙකක් සහ අවාසි දෙකක් ලියන්න.

(ලකුණු 10)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk